## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අභිතකර මතය

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් නියෝජිතායතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 අභිතකර මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියෝජිතායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය නියෝජිතායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියෝජිතායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියෝජිතායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජිතායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස නියෝජිතායතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියෝජිතායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නියෝජිතායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ නියෝජිතායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නියෝජිතායතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 21 වන ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී වාහන නඩත්තු හා අළුත්වැඩියාව වෙනුවෙන් දරා තිබූ රු. 904,956 ක් ප්‍රාග්ධනිත කර ඊට අදාල රු. 133,523 ක් ක්ෂය වෙන්කිරීම්ද ගලපා තිබුණි. මෙම නිසා මෝටර් රථ වල වටිනාකම රු. 904,956 ක් හා වර්ෂයේ ඌණතාවය රු. 771,433 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කර තිබුණි. එසේම ප්‍රමිතියේ ඡේද අංක 90 ප්‍රකාරව රු. මිලියන 4,088 ක් වූ ප්‍රත්‍යාගණන සංචිතය සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | ඔබ විසින් මෙහිදි පෙන්වා දෙන කරුණ සම්බන්ධයෙන් ඉදිරි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදි සැලකිල්ලට ගනු ලැබේ. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව වත්කම් ගිණුම්ගත කළ යුතු අතර හෙළිදරව් කිරීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| ii) නියෝජිතායතනයට එරෙහිව කම්කරු උසාවියේ ගොනුකර තිබූ නඩු 02 ක් සහ මානව හිමිකම් කොමිෂමෙහි ගොනුකර තිබූ නඩු 06 ක් පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 100 වන ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබූ අතර මේ සම්බන්ධයෙන් විය හැකි අසම්භාව්‍ය වගකීම තක්සේරු කිරීමට කටයුතු කරද නොතිබුණි. | 2019 අවසාන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට ප්‍රථම තම අංශ වලට අදාලව ගිණුම් ප්‍රකාශන වල හෙළිදරව් කල යුතු සියළුම කාරණා මුදල් අංශය වෙත එවන ලෙස දන්වා සිටි නමුදු අප වෙත මේ සම්බන්ධයෙන් වාර්තා නොවූ බැවින් ඒවා ගිණුම් ප්‍රකාශන වල හෙළි දරව් කිරීමට හැකියාවක් නොතිබුනි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කළ යුතුයි. |
| iii) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 10 හි 39 ඡේදය ප්‍රකාරව සේවා ආදායම හඳුනාගැනීමට අදාලව අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය අනාවරනය කර නොතිබුණි. එසේම නියෝජිතායතනය විසින් බාහිර පාර්ශවයන්ට උපදේශන සේවා සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබුණු රු. 102,108,067 ක් වූ උපදේශන සේවා ආදායම ආදායම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේම සේවා ගනුදෙනු කරුවන්ගෙන් ලැබී තිබුණු මුදල් උපයෝගී කරගෙන සේවා සැපයීම සඳහා දරා තිබුණු රු. 86,974,317 ක වියදම් , සේවා සැපයීම් වියදම් ලෙස ගිණුම් ගත නොකර ණයහිමි ශේෂ වලට ලියාහැර තිබුණි. මේ අනුව නියෝජිතායතනයේ සේවා සැපයීම් ආදායම් හා වියදම් මූල්‍ය ප්‍රකාශන වලින් පෙන්නුම් නොකෙරුණි. | වසර ගණනාවක සිට ගිණුම් සැකසීමේදි පදනම් කර ගන්නා ලද ක්‍රමය වූයේ 2019 මූල්‍ය ප්‍රකාශන තුල නිරූපනය කර ඇති ආකාරයයි. 2020 මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේදි පෙන්වා දී ඇති පරිදි කටයුතු කරනු ලැබේ. | උපදේශන සේවා ආදායම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අනුව ගිණුම්ගත කළ යුතු වේ. |
| iv) නියෝජිතායතනය වෙත මුහුදු රළ නිරීක්ෂණ ස්ථාන ඉදිකිරීම සඳහා 2016 - 2019 වර්ෂ වලදී ලැබී තිබුණු රු.15,249,004 ක විදේශ ප්‍රදානයන්, විදේශ ප්‍රදානයන් ලෙස ගිණුම් ගත නොකර ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙයින් රු.2,777,917ක් වැය කර ගොඩනගා තිබුණු ප්‍රාග්ධන වත්කම් ක්‍රමක්ෂය කිරීමට පියවර ගෙනද නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම ප්‍රදාන වලින් වැය කර තිබුණු සමස්ථ පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම වූ රු.8,361,371 ක් වූ අදාල ණයහිමි ගිණුමෙන් අඩුකර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | මෙම කරුණ පිළිගන්නා අතර ඉදිරි මූල්‍ය ප්‍රකාශන වලදි මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කළ යුතු වේ. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **i)** සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු ඉඩම් හා ගොඩනැගිලි , කාර්යාල උපකරණ, මෝටර් වාහන සහ නැව් හා බෝට්ටු යන වත්කම් ශේෂයන් හා ඊට අනුරූපීව ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබුණු ශේෂයන් අතර මුළු එකතුව රු.3,562,506 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉඩම් හා ගොඩනැගිලි , කාර්යාල උපකරණ, කම්පියුටර්ස් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර නොතිබූ අතර මත්ස්‍ය ටැංකි, බෝට්ටු හා නැව්, මෝටර් වාහන වැරදි ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කල යුතු අතර මූල්‍ය ප්‍රකාශන සැසඳීම් කළ යුතුයි. |
| ii) 2014 වර්ෂයේදී නියෝජිතායතනයට ප්‍රදාන ලෙස ලැබී තිබු රු.9,390,000 ක් වටිනා මෝටර් රථයක වටිනාකම හා රාජ්‍ය ප්‍රදාන යටතේ ගිණුම් ගත කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. ඒසේම නියෝජිතායතනය විසින් භාවිතා කරන පනාපිටිය හා කප්පරතොට පිහිටි පිළිවෙලින් හෙක්ටයාර 3.416 ක් සහ හෙක්ටයාර 1.025 ක් වූ ඉඩම් 02 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. තවද වටිනාකම රු.268,750,000 ක් ලෙස ගිණුම්ගත කර තිබූ රැකව, කල්පිටිය හා කඩොල් කැලේ ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නියෝජිතායතනය විසින් භාවිතා කරන කප්පරතොට හා පනාපිටිය ඉඩම් ඉදිරියේදි තත්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන අතර දැනට ගිණුම්ගත කර තිබෙන රැකව, කල්පිටිය හා කඩොල්කැලේ ඉඩම් වල අයිතිය ලබා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතියි. | ආයතනයට අයත් වත්කම් නිවැරදිව පවරාගෙන ගිණුම්ගත කළ යුතුයි. |
| iii) පූර්ව වර්ෂ වැරදි නිවැරදි කිරීමේදී සමුච්චිත අලාභයට ගැලපීම් කරන ලද එකතුව රු. 44,708,465 ක් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයට ගලපා තිබුණි. | ඉදිරියේදී මෙම ගැටළු ඇති නොවන ආකාරයට මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කරනු ලබන බව දන්වා සිටිමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතු වේ. |
| iv) අභිජනනාගාරයක් ඉදිකිරීම සඳහා දේශීය ප්‍රදාන යටතේ ප්‍රාග්ධනිත කරන ලද රු. 27,640,331 ක වත්කමට අදාල රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය එම ගිණුමින් අඩු නොකර භාණ්ඩාගාර ප්‍රදාන යටතේ අඩුකර තිබුණි. | ඉදිරි ගිණුම් ප්‍රකාශ තුල මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම්ගත කළ යුතුයි. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| උපචිත වියදම් | 4,281,761 | සනාථ කර ගැනීම සඳහා සාක්ෂි ඉදිරිපත් නොවූ අතර වසර 3 සිට 4 දක්වා කාලයක් නොපියවා තිබුණි. | මෙම රු. 4,281,761 ට අදාල ලේඛන සොයා ගැනීමට නොහැක. මෙම කරුණු නිරාකරණය කර ගැනීමට කටයුතු කරමින් පවති. | **උපචිත වියදම් සනාථන ලබාදිය යුතු අතර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.** |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම

### 1.6.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමණානාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ධීවර වරායන් 06 ක් සංවර්ධනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් පිළියෙල කිරීම වෙනුවෙන් බාහිර ආයතනයකට රු. 1,612,898 ක් වැඩිපුර ගෙවා තිබුණද එය වර්ෂ 06 කට වැඩි කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වැඩිපුර ගෙවීමට වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන එම නිළධාරීන් සම්බන්ධව නීතිමය පියවර ගැනිමට කටයුතුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය සමඟ ඉදිරි කටයුතු සාකච්ජා කරමින් පවතී. | වැඩිපුර ගෙවීම් සඳහා වගකිව යුතු නිළධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 104 | 2009 වර්ෂයේදී මිලට ගත් රු. 411,000 ක පරිගණක මෘදුකාංගයක් හා රු. 52,000 ක් වූ පරිගණකයක් 2012 වර්ෂයේදී අස්ථාන ගත වී තිබුණද ඒ සම්බන්ධයෙන් මෙම මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කර ඇති අතර එහි ලබා දී ඇති උපදෙස් අනුව කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුයි. |
| මුදල් රෙගුලාසි 387 | කිසිම රාජ්‍ය ආයතනයක් විසින් සිය රාජකාරී බැංකු ගිණුමකින් අයිරා ලබාගැනීම තහනම් වුවද, නියෝජිතායතනයේ බැංකු ගිණුම් අංක 214-1-001-3-3629680 හරහා 2019 දෙසැම්බර් මස රු. 6,151,631 දක්වා තාවකාලික අයිරා පහසුකම් ලබාගෙන ඊට අදාලව පිළිවෙලින් තාවකාලික අයිරා ගාස්තු රු. 5,000 ක් හා පොලී වියදම් රු. 12,163 ක් ගෙවා තිබුණි. | මේ තත්වය ඇති වුයේ දෙසැම්බර් මස සේවක වැටුප් සඳහා මහා භාණ්ඩාගාරයෙන් අක් මුදල් නියමිත දිනයේ නොලැබී පසු දින ලැබීම හේතුවෙනි. බැංකුව විසින් අය කර ගන්නා ලද ගාස්තු නැවත ගිණුමට බැර කිරීමට මහ භාණ්ඩාගාරය එකග වී ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුයි. |
| මුදල් රෙගුලාසි 757(2) | සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය 2020 මාර්තු මස 31 දිනෙන් අවසන් කර විගණකාධිපති වෙත එම වාර්තා යැවීම අනිවාර්ය වුවත් පැවති කොවිඩ් වසංගත තත්වය හේතු කොටගෙන මෙම වාර්තා යැවීමට හැකි වුයේ 2020 අගෝස්තු මසදීය. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුයි. |
| 2011 අප්‍රේල් 21 දිනැති අංක MOFP/ERD/2011/1 දරණ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය | ව්‍යාපෘති සඳහා විදේශ ප්‍රදාන ලබා ගැනීමේදී ඒ සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාව ලබාගත යුතු වුවද සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 2 කදී එම එකඟතාවය හා අනුමැතිය ලබාගැනීමකින් තොරව | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | රු. 22,487,492 ක් සෘජුව ආයතනයට විදේශාධාර ලබාගෙන තිබුණි. | | |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 7.4.1 ඡේදය | වාර්ෂිකව අවම වශයෙන් විගණන කමිටු රැස්වීම් 4 ක් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේද රැස්වීම් වාර 3 ක් පමණක් පවත්වා තිබුණි. | අවස්ථා කිහිපයකදි රටේ පැවති වාතාවරණය මත අධ්‍යක්ෂ මණ්ඩලය පත්විමේ ප්‍රමාදය මත මේ තත්වය ඇති වුනි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුයි. |
| 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් හා සංවර්ධන නියෝජිතායතන පනත සහ 1996 අංක 32 දරණ සංශෝධිත පනතේ 18 වන වගන්තිය | පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳව යෝජනා භාර ගැනීම හා ඇගයීම සහ නියෝජිතායතනයේ වාර්ෂික වැඩ නියමාවලිය හා අයවැය ලේඛනය සම්බන්ධයෙන් මණ්ඩලයට නිර්දේශ කිරීම, කමිටුව වෙත ඉදිරිපත් කරන වාර්තා භාර ගැනීම හා ඇගයීම සහ අනුමත ව්‍යාපෘතීන් පිළිබඳ ප්‍රගතිය සමීක්ෂණය කිරීම සහ ඒ ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම, අවස්ථෝචිත පරිදි මණ්ඩලය විසින් හෝ සභාව විසින් කමිටුව වෙත යොමුකරනු ලබන විද්‍යාත්මක හෝ තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් උපදෙස් ඉදිරිපත් කිරීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික කමිටුවක් පත් කළ යුතු වුවත් නියෝජිතායතනය විසින් විද්‍යාත්මක හා තාක්ෂණික කමිටුව 2014 වර්ෂයේදී පත්කර තිබුණද පර්යේෂණ වල කාර්යසාධන ඇගයීමට ලක්කර නොතිබූ අතර එම කමිටුව අක්‍රීය තත්ත්වයේ පැවතුණු අතර විගණනය සිදුවන 2020 ජුලි වන විටත් විද්‍යාත්මක හා තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා නව සාමාජිකයින් පත් කර නොතිබුණි. | වර්ෂ කිහිපයක සිට මෙම කමිටුව සඳහා සාමාජිකයන් පත් කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා යවා ඇතත් පත් කිරීම් සිදු කර නොමැත. 2019 මාර්තු මස 03 දින සහ 2019 වර්ෂයේ සැප්තැම්බර් මස ලිපි මඟින් ද දැනුවත් කිරීම් සිදු කර ඇත. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් හා සංවර්ධන නියෝජිතායතන පනතේ 34 වගන්තිය | නියෝජිතායතනය විසින් සිදුකරනු ලබන අධ්‍යයන, පර්යේෂණ, අත්හදා බැලීම් හා වෙනත් විමර්ශන සහ ගවේෂණ හා සොයා ගැනීම් වලට අදාළව ලබාගන්නා ලද දත්ත, වාර්තා සහ විස්තර අඩංගු ලේඛනයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අදාල කාර්යයන් පවත්වා ගෙන යාම පුස්තකාලය වෙත පවරා ඇති අතර එහි ඇති දත්ත පද්ධතිය (Data Base) තුල අදාල පර්යේෂණ වාර්තා, ජර්නල් සියල්ල ගබඩා කර ඇත. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුයි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.16,444,930 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 32,954,047 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,509,117 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට නඩත්තු වියදම් රුපියල් මිලියන 27 කින්ද පර්යේෂණ හා සංවර්ධන වියදම් රුපියල් මිලියන 14 කින්ද වෙනත් මෙහෙයුම් වියදම් රුපියල් මිලියන 62 කින්ද අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචන**

**3.1** **කළමනාකරණ අකාර්යක්‍ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| i) නියෝජිතායතනය විසින් 2017 වර්ෂයට පෙර සිට සොයාගත් පරිදි අධිශිතකරණ රහිත බහුදින යාත්‍රාවල මත්ස්‍ය අස්වැන්නෙහි පසු අස්වනු හානිය සියයට 40 පමණ වන බව සොයාගෙන තිබූ අතර පසු අස්වනු හානිය අවම කිරීම සඳහා කටයුතු සිදුකිරීම වෙනුවට තවදුරටත් පසු අස්වනු හානිය තක්සේරු කිරීම සඳහා 2018 සහ 2019 වර්ෂ තුලදී එකතුව රු. 7,490,550 ක් වැයකර පර්යේෂණ සිදුකිරීම මඟින් පර්යේෂණ ප්‍රතිඵලය මහජනතාවට ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීමට කළමනාකරණ මණ්ඩලය කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | 2018 සහ 2019 දී පසු අස්වනු තාක්ෂණ අංශය මඟින් සිදු කල යුතු අදාළ වෙනත් අධ්‍යනයන් (කාර්යන්) කිහිපයක් සඳහා ද මෙම ව්‍යාපෘතිය යටතේ අමතරව මුදල් වියදම් කර ඇත. එම වෙනත් අධ්‍යනයන් පහත දක්වා ඇත.<br><br>2018 වසරදි ව්‍යාපෘති අංක 4.1.1<br><br>• තෝරා ගත් ආර්ථික මධ්‍යස්ථාන (03) වලින් සාම්පල් රැස් කිරීම හා ඒවා මල අපද්‍රව්‍ය වලින් හා රෝගකාරක බැක්ටීරියා වලින් දූෂිත වී ඇත් දැයි පරීක්ෂා කිරීම.<br><br>• ශ්‍රී ලංකාවේ තෝරාගත් ප්‍රදේශවල ස්ථාපිත මත්ස්‍ය කර්මාන්තය සඳහා අයිස් සපයනු ලබන අයිස් නිෂ්පාදනාගාර වල අයිස් නියැදි පරීක්ෂා කිරීම. | පර්යේෂණ ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු අතර පර්යේෂණ ප්‍රතිඵලය මහජනතාවට ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතුයි. |

| | | |
|---|---|---|
| | • විකිරණශීලි අවශේෂ පරීක්ෂාව සඳහා මත්ස්‍ය සාම්පල් එකතු කිරීම හා විශ්ලේෂණය කිරීම.<br><br>• තාක්ෂණික දැනුම ලබා දීම හා දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරිම.<br><br>2019 වසරදී ව්‍යාපෘති අංක 4.1<br><br>• අයිස් නිෂ්පාදනාගාර වල නිපදවන අයිස් වල ගුණාත්මක භාවය පිළිබඳ විමර්ශනය.<br><br>• විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන වල මත්ස්‍ය අලෙවිසැල් වල සනීපාරක්ෂක තත්ත්වය සහ ගුණාත්මකභාවය තක්සේරු කිරීම.<br><br>• ශ්‍රී ලංකාවේ ආනයනික ධීවර නිෂ්පාදන වල විෂ සහිත විකිරණශීලි අපද්‍රව්‍ය (රේඩියෝ නියුක්ලයිඩ්) විමර්ශනය කිරීම. | |
| ii) 2017 වර්ෂයේදී බහුදින යාත්‍රා වල මත්ස්‍ය අස්වැන්නෙහි ගුණත්ව හානිය අවම කිරීමේ අරමුණින් රු. 950,130 ක් වැයකර අධිශීතකරණ පද්ධතියක් සහිතව බහුදින යාත්‍රාවක් නිර්මාණය කිරීම සඳහා උපදේශන වාර්තාවක් මොරටුව විශ්ව විද්‍යාලයෙන් ලබාගෙන තිබුණද එම වාර්තාව ඵලදායී ලෙස යොදාගෙන බහුදින යාත්‍රාවක් නිර්මාණය කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | 2017 දී මෙම උපදේශන වාර්තාව නාරා ආයතනයට ලබා ගැනීමට ප්‍රධාන අරමුණ වුයේ, නාරා ආයතනයේ ධීවර බෝට්ටු නිර්මාණය කිරීමේ තාක්ෂණය සඳහා දැනුම ඇති විද්‍යාඥයින් නොමැති නිසාය. ඒ අනුව මෙම උපදේශන වාර්තාව නාරා ආයතනයට ලබා ගැනීමෙන් පසුව බහුදින යාත්‍රා තුල මසුන්ගේ පසු අස්වනු හානිය අවම කිරීම සඳහා තම ධීවර යාත්‍රා තිබිය යුතු මසුන් සිසිල් කිරීමේ කුටිර නියමිත තාක්ෂණ මත නිපද වීම පිළිබඳ දැනුම ලබා දීම හා දැනුවත් කිරීමේ තාක්ෂණික වැඩසටහන් හරහා යාත්‍රා නිපදවන්නන් සහ යාත්‍රා හිමිකරුන් වෙත ලබා දීම සඳහා කටයුතු කර ඇත. 2017 වසරේ ධීවර අමාත්‍යාංශය මඟින් දියත් කළ නියමිත තාක්ෂණයෙන් යුතු නව විශාල ධිවර යාත්‍රා (අඩි වැඩි 55, ශීත ජල ටැංකි සහිත ධීවර යාත්‍රා) නිපදවීමට මූල්‍ය ආධාර දීමේ ව්‍යාපෘතිය තුල පිහිටවූ තාක්ෂණික කමිටු වලදී භාවිතා කිරීම සඳහා ද මෙම උපදේශන වාර්තාව භාර දෙන ලදි. | නියෝජිතායතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණක් වන ජලජ සම්පත් ප්‍රයෝජනයට ගැනීම හා පාලනය කිරිම සහ කළමනාකරණය කිරිම යන්න ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුයි. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නියෝජිතායතනය වෙත විධිමත් පරිදි පවරා නොගත් ඉඩමක, නියෝජිතායතනයේ අරමුණු වලින් බැහැරව රු. 15,245,000 ක් වැයකර 2014 වර්ෂයේදී මත්ස්‍ය අලෙවි සැලක් බේරුවල ඉදිකර තිබූ අතර මේ දක්වා එම අලෙවි සැල නිෂ්කාර්යව පැවතුණි. | ඇමුණුමක් පමණක් ඉදිරිපත් කර ඇත. | විධිමත් පවරා නොගත් ඉඩම් වල රජයේ ප්‍රතිපාදන වැයකර ඉදිකිරීම් කටයුතු නොකිරීමට අවශ්‍ය නීතිරීති සම්පාදනය කල යුතුයි. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බෝට්ටු 02 ක් නිෂ්පාදනය කිරීම සඳහා 2011 වර්ෂයේදී රු. 4,493,052 ක් බැගින් අධිබලැති බෝට්ටු එන්ජින් දෙකක් මිලට ගෙන බෝට්ටු 02 ක් නිෂ්පාදනය කිරීමේ කටයුතු ආරම්භ කර ඒ වෙනුවෙන් අතිරේකව රු. 2,902,938 ක්ද වැය කර තිබුණු නමුත් එම එන්ජින් දෙක හා නිෂ්පාදනය අවසන් නොකල බෝට්ටු 02 ගබඩාවේ නිෂ්කාර්යව තබා තිබුණි. | මෙය වෙනත් රාජ්‍ය ආයතනයක අවශ්‍යතාවය වෙනුවෙන් භාවිතා කිරීමට කටයුතු කරන ලබන විට අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ පැමිණිල්ලක් විභාග කර ඒ පිලිබඳ නඩු කටයුතු සිදුවන බැවින් මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග තිරණය කිරීම සඳහා අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ උපදෙස් පතා ලිපියක් යොමු කර ඇත. | නිෂ්කාර්ය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතු අතර මේ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුකල යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **i)** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යක්ෂ මුදල් සහ පර්යේෂණ සහකාර යන තනතුරු සඳහා අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය අනුව මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොතිබියදී අධ්‍යක්ෂ මූල්‍ය තනතුර සහ පර්යේෂණ සහකාර තනතුර සඳහා නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගෙන පිළිවෙලින් 2017 මැයි සිට 2019 දෙසැම්බර් 31 සහ 2014 මැයි සිට 2019 දෙසැම්බර් 31 දක්වා පිලිවෙලින් වැටුප් හා දීමනා ලෙස එකතුව රු. 5,436,226 ක් සහ රු. 2,898,393 ක් ගෙවා තිබුණි. | ඇමුණුමක් පමණක් ඉදිරිපත් කර ඇත. | සුදුසුකම් ඇති නිළධාරීන් බඳවාගෙන නියෝජිතායතනයේ කාර්යසාධනය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| ii) | නියෝජිතායතනයේ සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පර්යේෂණ කටයුතු වලට ඍජුවම සම්බන්ධ වන තනතුරු 22 ක පුරප්පාඩු 119 ක් පැවතුණි. මෙම තනතුරු වල පුරප්පාඩු දිගින් දිගටම පැවතීම නියෝජිතායතනයේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට අහිතකර ලෙස බලපා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | ඇමුණුමක් පමණක් ඉදිරිපත් කර ඇත. | කාර්ය මණ්ඩලය නිසි පරිදි සැලසුම් කළ යුතු අතර පුරප්පාඩු පිරවීම තුලින් කාර්යසාධනය වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| iii) | ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය දියුණු කිරීමටත් එන්ජින් අලුත්වැඩියා හා නඩත්තුව පිළිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඇතුළු පාඨමාලා 10 ක් හා වැඩමුළු 5 ක් පැවැත්වීම සඳහා 2019 වර්ෂයේ සමාජ ආර්ථික හා අලෙවි අංශය මඟින් රු. 1,000,000 ක ඇස්තමේන්තුවක් පාලක මණ්ඩලය වෙත යොමුකර අනුමැතිය ලබාගෙන තිබූ අතර එම වර්ෂය තුල වැඩසටහන් 4 ක් පමණ පවත්වා ඒ සඳහා රු. 1,205,402 ක මුදලක් වැයකර තිබුණි. | සමාජ ආර්ථික අංශය මඟිනි පුහුණු වැඩසටහන් 04 ක් පැවැත්වූ අතර වැඩමුළු 01 ක් පවත්වන ලදි. මේ සඳහා වැය කල සමස්ත මුදල රුපියල් ලක්ෂ 08 කට ආසන්න වේ. ඒ අනුව ඇස්තමේන්තු ගත මුදල ඉක්මවා වියදම් කර නොමැත. | මානව සම්පත් නිසි අයුරින් කළමනාකරණය කළ යුතු අතර මේ පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |